# ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND


*Phone & Fax* : 020 7428 9388
E-mail : lanka.viththi @ virgin.net

*කර්තෘ* : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

*චිත්‍ර* : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna

*පරිගණක කටයුතු* : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal

*ඡායාරූප* : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

## අනුර බණ්ඩාරනායක



කලින් විපක්ෂ නායකයෙකුව සිටි, පාර්ලිමේන්තුවේ කතානායකවරයෙකුව සිටි, එමෙන්ම මෑතක සංචාරක ඇමති, ජාතික උරුමයන් පිළිබඳ ඇමති ආදි වශයෙන් කටයුතු කළ ගරු අනුර බණ්ඩාරනායක මහතා සති දෙකකට ඉහතදී අභාවප්‍රාප්තවීම බොහෝ දෙනා තුළ සංවේගයක් ඇති කළේ ය. ඊට හේතූන් බොහෝ වෙති.

එතුමන් මියයන විට 59 වන වියේ සිටියේ ය. එය සැබැවින්ම ලංකාව වැනි රටක දේශපාලනයේ මුහුකුරා ගිය වයස ය. වයස කුමක් වුවත් මරණය එන බව නිසැක නමුත් එය දේශපාලනඥයෙකු මිය යා යුතු කාලය ලෙස නොසිතේ. ඔහුට පරම්පරාවෙන් ආ දේශපාලන හැදියාවක් තිබිණ. තම මවත් පියාත් දෙදෙනාම රටේ නායකයින් වශයෙන් පාලනයේ ඉහළම තැන සිටි බැවින් එකම පුතා ලෙස ඔවුන්ගේ ඇවෑමෙන් යම් දිනක ලංකාවේ නායකත්වයට අනුර පත්වේයයි බොහෝ දෙනාගේ නිසැක කල්පනාව විය. දේශපාලනය බුක්තියට සවිකර ගත් දකුණු ආසියාවේ දේශපාලන අධිකාරී පවුල් ගැන සිතන විට අතට ආ දේ අතින් ගිලිහී ගිය අවාසනාවන්ත කමක් සමහරුනට ඔහු තුළ පෙනේ. අනෙක් කරුණ ඔහුගෙන් පසු බණ්ඩාරනායක නාමය අවසන් අවසන් වීම ය.

අනුර බණ්ඩාරනායක මහතාට උපතින්ලත් වරප්‍රසාද, හැකියාවන්, හා දැනුම බොහෝ වූ නමුත් ඔහු ඒවායින් කිසිදු ප්‍රයෝජනයක් නොගත් බව පැහැදිලි ය. දෙමාපියන් දෙදෙනාම ලංකාවේ රාජ්‍ය නායකයන් වූ බැවින් ඔහුට ලංකාවේ ද, ලෝකයේ ද පිළිගැනීමක් ඉබේම ලැබිණ. ඉංග්‍රීසි, සිංහළ ද්විභාෂාව මනා ලෙස හසුරුවමින් කතාකරන්නට ඉහළ හැකියාවක් තිබිණ. එම කතිකත්වය සිය පියාගෙන් නිසැකවම උරුමවන්නට ඇත. පෙනුම කඩවසම් වීය. එසේම ඉඩකඩම් ආදියෙන් උරුම දේපළ ඔහුට ඕනෑවටත් වඩා තිබුණි. මේ කී දේවල් ලංකාවේ වෙන කෙනෙකුට අත්වී නම් ඒ පුද්ගලයා කොහි නවතීදැයි හිතාගන්නට බැරි ය. එහෙත් අනුර එසේ නොවූයේ මන්ද?

උරුමයෙන් ලැබූ ඉහතකී ලක්ෂණයන්ට අමතරව දේශපාලනයට තීක්ෂණ බුද්ධිය මෙන්ම ප්‍රතිවාදීන් කපාගෙන ඉදිරියට කෙසේ හෝ යාමේ සට කපට ප්‍රයෝගකාරී බව ද තිබිය යුතු ය. එය අනුරට තිබුණේ නැත. එබැවින් බොහෝ විට ඔහු දේශපාලන කැලෑවේ අතරමං වීය. නිවැරදි තීරණ ගන්නට ඔහු තුළ වූ අපොහොසත්කම ද හරි උපදෙසක් දෙන්නට කෙනෙකු ඇසුරුකරන්නන් අතර නැතිවීම ද ඔහුගේ අසාර්ථකත්වයට බලපෑවේ ය. එහෙත් එතුමන් කාරුණික, කිසිවෙකු හා තරහ නැති, ධනයට කෑදර නැති, අවංක මිනිසෙකු බව මුලු ලංකාවම දනිති. ඒ හොඳටම ප්‍රමාණවත්ය.



## බන්ධන බිඳෙන බක්මහ

බක් මහ යන්නෙහි මුලට එන බක් යන සිංහල ප්‍රකෘතිය හැදෙන්නෙ බන්ධන බිඳුණු යන අරුත් දෙන භග් යන පාලි ප්‍රකෘතිය ලිහිල්වෙලයි. භගවා යනුවෙන් බුදුහිමියන් හැඳින්වෙන්නෙ උන්වහන්සේ සියළුම සංසාර බන්ධනයන් නොහොත් ක්ලේශ බන්ධනයන් බිඳුණු කෙනෙකු වීම නිසයි. බුදු, පසේ බුදු, මහරහත් යන ආර්යභාවයට පත්වන විට බිඳී යන්නෙ දස සංයෝජන නමැති සංසාර බන්ධන දහයකුයි.උන්වහන්සේලා පිරිනිවන් පෑවාට පසු පුනරුත්පත්තියකින් නැවත සංසාරයට එක් නොවන්නෙ එසේ සංසාර බන්ධන බිඳී තියෙන නිසයි.

සංසාරය කියන්නෙ නැවත නැවත ඉපදෙමින් ජීවිත ගමන පවත්වාගෙන යෑමයි. පැරණි සිංහලයාගේ ජීවිත ගමන මූලික වශයෙන් බැඳිලා තිබුණෙ ගොවිතැනටයි. එසේ ගොවිතැනට බැඳෙන්නෙ ජීවිතයට තියන සංසාරගත බැඳීම නිසයි. ජීවත් වෙන්න තියන ඕනෑකම නිසයි. හැම ඕනෑකමකටම මුල් වෙන්නෙ තණ්හාවයි. බුදුහිමියන් වදාළ චතුරාර්ය සත්‍ය ධර්මය අනුව අප විඳින හැම සංසාර දුකකටම හේතුව තණ්හාව නමැති දුක්ඛ සමුදයයි.

පැරණි සිංහල ගොවියා ටික කාලෙකට හෝ ගොවිතැනින් මිදී විවේකයක් ලැබුවෙ මැදින් මහේදි මහ කන්නයෙහි අස්වැන්න නෙලාගෙන අටුකොටු පුරවගෙන බක්මහේ වැටෙන ගොඩ වැස්සෙන් කුඹුරු වපුරා කමත්වලත් ගෙවතු වලත් එළවළු වගාකරගැනීමෙන් පසුවයි. එසේ වගා කෙරෙන එළවළු පැළත් සරුවට වැඩෙන්නෙ බක්මහේ දි හැන්දෑවට බක්මහ අකුණුත් සමග ඇද හැලෙන සන්ධ්‍යා වර්ෂා නමැති ගොඩ වැහි වලිනුයි. මෙම ප්‍රබෝධමත් කාල වකවානුවේදි සිංහලයන් පවත්වන ජාතික උළෙල නොහොත් සැණකෙළිය වන්නෙ සිංහල අවුරුදු උත්සවය නමින් හැඳින්වෙන නැකැත් කෙළිය වන බක්මහ උළෙලයි.

පැරණි සිංහලයාට බක්මහ උළෙලින් විනෝදවීමට ඉඩකඩ ලැබුණෙ ගොවිතැන නමැති ප්‍රධාන ජීවනෝපායෙන් මිදී ලැබෙන කායික හා චිත්ත විවේකය නිසයි. භාවනාවෙන් කෙරෙන් නෙ කයට මෙන් සිතටත් විවේකයක් දීමයි. ඒ සඳහා කරණීය මෙත්ත සූත්‍රයෙහි සඳහන් වන සල්ලහුකවුත්ති නමැති සැහැල්ලු පැවැත්ම අවශ්‍යයි. භාවනානුයෝගී ජීවිතයක් කියන්නෙ සැහැල්ලු පැවැත්මක්. කායිකවත් මානසිකවත් විවේක සුවයක් විඳීමක්.

බෞද්ධ භාවනානුයෝගී ජීවිතයේදී ක්‍රමක්‍රමයෙන් සිදුවන්නෙ සංසාර බන්ධන ටිකෙන් ටික බිඳි බිඳී ලිහිල්ව යාමකි. රහත් ඵලයට පත්වන්නෙ දස සංයෝජන නමැති සංසාර බන්ධන දහයම බිඳීයාමයි. සෝවාන් වීමේදි බිඳෙන්නෙ සක්කාය දිට්ඨි විචිකිච්ඡා සහ සීලබ්බත පරාමාස සංසාර බන්ධන තුන පමණයි. එයින් පසු ඉතිරිවෙන සංසාර බන්ධන හත බිඳී යන්නෙ නිරායාසයෙනුයි. ස්වාභාවිකවයි.

සොවාන් වීමෙන් පසු ගතවෙන්නෙ ආයාසයෙන් තොර සැහැල්ලු ජීවිතයක්. ඊට හේතුව සෝවාන්වීමේදී සක්කාය දිට්ඨිය නමැති මමත්වය මුළුමනින්ම නැතිවී යෑමයි. එයින් පසු ආයාසයක් නොහොත් උත්සාහයක් කිරීමට අවශ්‍ය මමය මාගේය කියන හැඟීම නැතිවුනාම ආත්මාර්ථකාමී ආයාසයකින් නොහොත් උත්සාහයකින් කිසිවක් කරන්නට බැරිවෙනවා. ඉන්පසු ජීවිතයේ හැමදෙයක්ම සිදුවන්නෙ නිරුත්සාහකව නිරායාසයෙනුයි. ඒ නිසා සෝවාන්වෙච්ච අයට බන්ධන බරෙන් මිදුණු බක්මහක් වෙනවා.

පුරා වෘත්ත අනුව මිණි පළඟකට සිත බැඳුණු චූලෝදර හා මහෝදර යන නාරජුන් දෙදෙනා අතරෙ ඇවිලෙන්නට ගිය යුද්ධය නවතනු සඳහා බුදුරදුන් දෙවෙනි වරට ලක්දිවට වැඩියේ බක්මහේ අව පසළොස්වක පොහෝ දිනයකයි. අපේ ජීවිතයත් අපට අඛණ්ඩ යුද්ධයක් වී තිබෙන්නෙ යම් යම් දේට තියන බන්ධන නමැති බැඳීම් නිසයි. අපේ මුළු ජීවිතයම බක්මහක් විය හැක්කේ ඒ බැඳීම් හග්නව නොහොත් කැඩී බිඳී ගිය තරමටයි.

♦ *සම්මානිත මහාචාර්ය ටි. එස්. අබේවික්‍රම* Harrow UK

## *බාල කාලේ අවුරුදු*



තුරු මුදුන් හි කොවුල් ගී සරින්
නැගෙන ඉරෙහි කිරණ ඉහිරෙමින්
එරබදු මල් වැටෙහි හැඩවෙමින්
අවුරුදු එයි ගමට කඩිනමින්

තුරු සෙවනැලි අතර ගැවසෙමින්
ඔච්චි බඩවැටියෙ රිංගමින්
අඹ දඹ කජු වැටෙන අහුලමින්
ඔඩොක්කුවට ගනිමි සන්තොසින්

තරුණ ළඳුන් සිනහ හඬින්නේ
අහසට ඔන්චිලි පැද යන්නේ
දැත වළලු ගැටෙන නදින්නේ
රබන් හඬින් ගම පිබිදෙන්නේ

නැකතට කිරිබත පිසගන්නේ
අම්මාගෙන් බත්කට කන්නේ
විහාරෙ සංටාර හඬින්නේ
අවුරුදු දා පන්සල් යන්නේ

♦ *විමලසිරි ගම්හේවා*
Colchester UK

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### *හිතොපදේශයෙන්*

න ගණස්‍යාග්‍රතො ගච්ජේත්-සිද්ධෙ කාර්ය සමං ඵලං
යදි කාර්ය විපතිශ්‍යාත් - මුඛරං තත්‍ර හන්‍යතෙ

*අර්ථය : යම්කිසි කටයුත්තකදී එය සාර්ථක වුවහොත් එහි ඵලය සියළු දෙනාටම සමව බෙදී යයි. නමුත් එය අසාර්ථක වුවහොත් හෝ විපතක් වූ කල්හි හෝ එහි මූලිකයා විනාශයට හෝ කරදරයට හෝ පත්වන්නේය. එබැවින් පෙරටුව ගමන්කිරීම අනතුරුදායකය.*

පයින් ගමන් යන පිරිසකට අතරමගදී අනතුරකට මුහුණ පාන්නට සිදුවුවහොත් පසුපසින් ගමන් කරන්නන්ට වඩා ඉදිරියෙන් යන්නාට අත්වන ප්‍රතිඵලය වඩාත් හානිකරය. නමුත් හොඳක් හෝ යම් ප්‍රතිලාභයක් ලැබුණහොත් එය සෙසු පිරිසට ද සමව බෙදී යයි. මෙම පද්‍යයේ සාමාන්‍ය අදහස මෙය වුවද මීට වඩා ගැඹුරු අර්ථයක්ද ගැබ්ව ඇති බව පෙනේ. යම් කටයුත්තක් කිරීමේදී ඉන් හොඳ ප්‍රතිඵල නෙලා ගැන්මට නම් ඒ සඳහා දක්ෂ, ස්ථානොචිත ප්‍රඥාවෙන් ක්‍රියාකරන, සුදුසු පුද්ගලයෙකු මූලිකත්වය ගත යුතුයි. එසේ නැතිව සුදුසු නුසුදුසු බව නොතකා ඕනෑම කටයුත්තකට ඕනෑම පුද්ගලයෙකු ඉදිරිපත් වුවහොත් ලැබෙන ප්‍රතිඵල හානිකරය. අනතුරුදායකය.

සමාජයේ බොහෝ දෙනෙකුගේ ස්වභාවය ඕනෑම කටයුත්තකදී කැපී පෙනෙනසේ ඉදිරියෙන් යාමටය. තමන්ගේ බැරි පුළුවන්කාරකම වටහා නොගෙන එසේ ඉදිරියට පැනීමෙන් ඔව්හු එම කාර්‍යය අවුල් කරති. ඉන් කිසිවෙකුට සිදුවන යහපතක් නැත. අවසන් ප්‍රතිඵලය අර්ථ ශූන්‍යය. දක්ෂයා හා බුද්ධිමතා අවශ්‍ය තැනදී පමණක් පෙරමුණ ගනී. ඕනෑ තැනදීත් එපා තැනදීත් ඉදිරියට යාම අන්‍යයන්ගේ හාස්‍යයට ලක්වීමකි.

ප්‍රායෝගික ජීවිතයට ඉතා ප්‍රයෝජනවත් මෙම අර්ථාන්විත පද්‍යය සමාජ ජීවිතයේ කටයුතු කරන්නේ කෙසේදැයි යන්නට ඉඟියක් කරයි. සමාජයේ වීරයන් සේ කැපී පෙනීමට වෙර දරන පුද්ගලයන් කවදත් සුලභය. බොහෝ අය ලාභ ප්‍රයෝජන මෙන්ම කීර්ති ප්‍රශංසා බලාපොරොත් තුවෙන් ඉදිරියට යාමේ මේනියාවෙන් ද පෙළෙති.

සමාජයේ තවත් කෙනෙක් පිටුපසින් හිඳ නිහඬව තමාට කළහැකි යමක් ඇත්නම් අවංකව තම ශක්ති ප්‍රමාණයෙන් තම යුතුකම් කොටස ඉටු කරයි. නිහඬ සේවයක් කරයි. ඒ අතරේ ඇතැමෙක් වැඩ කිරීම කෙසේ වෙතත් ඇතුළත කිසිම හරයක් නැති මහත් වූ හඬක් පමණක් නගන බෙරය මෙන් වැඩක් නොකරමින් හඬ පමණක් නගති. තමාට නොවැටහුනද මින් කරන්නේ තමන්ගේ අඥාණකම ප්‍රදර්ශණය කිරීමයි. පිරුණු කළය මෙන් කෘතහස්ත ප්‍රාඥයා කිසිදු ශබ්දයක් නොනගා නිහඬව සමාජ මෙහෙවරක යෙදෙයි.

සන්තාපයෙන් තොර සන්තෝෂී ආස්වාදජනක ජීවිතයක් ගතකිරීමට බුද්ධිමත් පුද්ගලයා ක්‍රියා කළ යුත්තේ තමා බලවතා, තමා ප්‍රධානියා ලෙස සිතීමෙන් නොව සුදුස්සාට සුදුසු තැන දීමෙනි. එවිට හැමට සතුටුදායක ප්‍රතිඵල නෙලාගත හැකිය.



♦ *පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි*
ලන්ඩන් බෞද්ධ විහාරය
London Buddhist Viharaya
The Avenue,
London W4 1UD


**ANOOMA & HEGODA Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 0 2 0 8 3 4 8 7 7 7 2

Work Permits and Highly Skilled
Migrant Applications done.
We also deal with visa refusal from
British High Commission in Colombo

Colombo Office

Hegoda & Hegoda
100/6 Rosemead Place, Colombo 7
Tel. 2672432 / 0777686632